## ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය - 2011

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| **භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| (i) | 1978 දෙසැ.19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයේ දැක්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ii) | අංක 01/2004 සහ 2004 පෙබ. 24 දිනැති චක්‍රලේඛය | වාර්ෂික කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් වලින් ජනනය වූ මූල්‍ය ප්‍රතිඵලය රු.2,017,213 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.25,050,384 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.23,033,171 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය රු.23,033,171 කින් වර්ධනය වීම සඳහා පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී පහත සඳහන් ආදායම් සහ වියදම් වල වැඩිවීම සහ අඩුවීම හේතුවී තිබුණි.

(අ) රජයේ ආධාර රු.25,881,632 කින් හෙවත් 37.45% කින් වැඩිවීම.

(ආ) වෙනත් ආධාර රු.2,437,871 කින් හෙවත් අනන්තයකින් වැඩිවීම.

(ඇ) සේවක දීමනා රු.2,390,129 කින් හෙවත් 10.27 % කින් වැඩිවීම.

(ඈ) සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය වියදම රු.10,709,682 කින් හෙවත් 29.52% කින් අඩුවීම.

(ඉ) නඩත්තු වියදම රු.10,437,368 කින් හෙවත් 133.12 % කින් වැඩිවීම.

(ඊ) ගිවිසුම්ගත සේවා වියදම රු.2,761,323 කින් හෙවත් 10.42 % කින් වැඩිවීම.

(උ) ක්ෂයවීම් වියදම රු.407,194 කින් හෙවත් 201% කින් වැඩිවීම.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

මාණ්ඩලික විද්‍යාලය මෙහෙයවනු ලබන උපාධි පාඨමාලාවට සමාලෝචිත වර්ෂයේ සහභාගි වූ සිසුන් සංඛ්‍යාව 83 ක් වූ අතර ඊට සාපේක්ෂව 2010 වර්ෂයේ සහභාගි වූ සිසුන් සංඛ්‍යාව 74 ක් විය. විස්තර පහත දැක්වේ.

| උපාධිධාරීන් සහභාගිවූ ආයතනය | උපාධිධාරීන් සංඛ්‍යාව 2011 | 2010 | වැඩිවීම/ (අඩුවීම) |
|---|---|---|---|
| යුද්ධ හමුදාව | 48 | 46 | 02 |
| නාවික හමුදාව | 13 | 11 | 02 |
| ගුවන් හමුදාව | 14 | 11 | 03 |
| ආරක්ෂක අමාත්‍යාංශය | - | 01 | (01) |

| | | | |
|---|---|---|---|
| විදේශීය | 08 | 05 | 03 |
| | 83 | 74 | 09 |

උක්ත කරුණු අනුව පහත සඳහන් දෑ විගණනයට නිරීක්ෂණය විය.

(අ) මාණ්ඩලික විද්‍යාලය මෙහයෙවනු ලබන උපාධි පාඨමාලාවට සහභාගි වන සිසුන් සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේ දී 09 කින් ඉහල ගොස් තිබුණි.

(ආ) ආදායම් සහ වියදම් ගිණුම අනුව සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු.99,455,085 ක් වූ අතර ඒ අනුව එක් උපාධිධාරියෙකු වෙනුවෙන් රු.1,198,254 ක පමණ පිරිවැයක් මාණ්ඩලික විද්‍යාලය විසින් දරා තිබුණු අතර 2010 වර්ෂයේ දී එක් උපාධිධාරියෙකු වෙනුවෙන් රු.1,272,551 ක වියදමක් දරා තිබුණි.

## 3.2 හඳුනාගත් පාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මාසික ජල බිල්පත් සඳහා ගෙවීම් කිරීමේ දී නියමිත දිනයන් වලදී ගෙවීම් සිදුකර වට්ටම් සහන ලබාගැනීමට හැකියාව තිබිය දී 2011 ජනවාරි මාසයේ සිට 2011 දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදයට අදාල ජල බිල්පත් නියමිත දිනවල දී නිරවුල් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් රු.66,667 ක වට්ටමක් ලබාගැනීමට විද්‍යාලයට තිබුණු හැකියාව අහිමිකර ගෙන තිබුණි.

(ආ) මාසික විදුලි බිල්පත් ගෙවීමේ දී බිල්පතේ සඳහන් නියමිත දිනයට පෙර ගෙවීම් කිරීමට කටයුතු නොකිරීම නිසාවෙන් 2011 වර්ෂය තුල රු.45,345 ක මුදලක් දඩ මුදල් ලෙස ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.
ඉහත ජේද 2 ක සම්බන්ධයෙන් මු.රෙ.210(1) සහ 210(2) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

# 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 ක්‍රියාකාරී සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අංක 5.1 ඡේදය ප්‍රකාර සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණ ද එහි ඇතුලත් දෑ ඉටුකර ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.2 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 පෙබරවාරි 28 දිනැති අංක එස්පී/එන්පීඒ දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

විගණනයේ දී නිරීක්ෂණය වූ පහත සඳහන් දුර්වල පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකල යුතුවේ.

(අ) ජංගම නොවන වත්කම් ගිණුම් ගත කිරීම

(ආ) වියදම් පාලනය

(ඇ) ජල සහ විදුලි බිල්පත් ගෙවීම